**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 17/93**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.08.13

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 371 හි විධිවිධාන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමේදී සිදුවී <u>ඇති විෂමතාවයන් ඉවත් කිරීම</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 371 හි විධිවිධාන පරිදි, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමේදී සිදුවී ඇති විෂමතාවයන් පහත සඳහන් පරිදි ඉවත් කිරීමට රජය තීරණය කර ඇත.

(I) 1971.09.30 දින සිට 1977.03.11 දින දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී එහි II පන්තියේ II ශ්‍රේණියෙහි අවුරුදු 10 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කළ දින සිට ක්‍රියාත්මක වන පරිදි එම නිලධාරීන්ගේ උසස්වීම් පෙරදාතම් කිරීම.

(II) ඔවුන් අදාළ වැටුප් පියවරවල පිහිටුවා හිඟ වැටුප් ගෙවීම.

(III) ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය ප්‍රතිශෝධනය කිරීම.

02. 1981.09.29 වන දින හෝ ඉන්පසු දිනයක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු සේවයේ ස්ථිර කර ඇති සහ පහත සඳහන් අවශ්‍යතා ද සම්පූර්ණ කර ඇති නිලධාරීන් එසේ දස අවුරුදු සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කළ දින සිට හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය කරන මෙම අවශ්‍යතා සම්පූර්ණ කළ දින සිට හෝ බලපැවැත්වෙන පරිදි II පන්තියේ I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(I) නියමිත දිනට පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව සිටීම හෝ ඒවායින් නිදහස් කරවා ගෙන සිටීම.

(II) දෙවෙනි භාෂාව සමත්ව සිටීම හෝ එම අවශ්‍යතාවයෙන් නිදහස් කරවා ගෙන සිටීම.

(III) ඉහත සඳහන් පරිදි II/I ශ්‍රේණියේ පිහිටුවීම සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ නියමිත දිනයන්හිදී සියළුම වැටුප් වර්ධක උපයාගෙන සිටීම.

සහ

(IV) ඉහත සඳහන් පරිදි II/I ශ්‍රේණියේ පිහිටුවීම සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සිදු කර ඇති කිසියම් වරදක් සම්බන්ධයෙන් විනයානුකූල දඬුවමකට භාජනය වී නොසිටීම.

03. ඉහත 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ ඉල්ලුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තම නිර්දේශයන්ද සමග අදාල අමාත්‍යාංශවල ලේකම්වරුන් මගින් මා වෙත ඉදිරිපත් කළ යුතුය. ( මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව මෙම චක්‍රලේඛයට අමුණා ඇති "අ" දරණ ආකෘතියට අනුව ඉල්ලුම්පත් පිළියෙල කර ගත යුතුය. )

අ.කලේ / එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

---

**"අ" ආකෘතිය ( අංක . . . . . . . .දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ <u>03 වෙනි ඡේදයේ සඳහන් පරිදි</u> )**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණිය සහ එම සේවයේ II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම අනුව 1981.09.29 දින හෝ ඊට පසු දිනක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර දහයක සතුටුදායක සේවයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් ශ්‍රී ලං.ප.සේ. II/I ශ්‍රේණියේ <u>පිහිටුවන ලෙස ඉල්ලීම</u>**

**<u>1 වන කොටස</u>**

01. (අ) නිලධාරියාගේ නම :-

(ආ) ශ්‍රී ලං.ප.සේ. II පනතියේ II ශ්‍රේණියට / III වන ශ්‍රේණියට පත් වූ දිනය :-

(ඇ) සේවයේ ස්ථිර කළ දිනය :-

(ඈ) දැනට සිටින පන්තිය / ශ්‍රේණිය හා එයට පත් වූ දිනය :-

02. (අ) වර්තමාන තනතුර සහ දෙපාර්තමේන්තුව :-

(ආ) රාජකාරි ලිපිනය :-

03. ශ්‍රී ලං.ප.සේ. ට බඳවා ගත් පිළිවෙල :-

- විවෘත තරඟ විභාගයෙන්
- සීමිත තරඟ විභාගයෙන්
- කුසලතා මත උසස් කරනු ලැබීමෙන්

(අදාල නොවන ද කපා හරින්න )

04. පහත සඳහන් විභාග වලින් සමත් වී සිටිද ? නැතහොත් නිදහස් කරවා ගෙන තිබේද ? එසේ නම් විස්තර සපයන්න.

**<u>සමත් වූ හෝ නිදහස් කරවා ගත් දිනය</u>**

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : . . . . . . . . . . . . .

දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : . . . . . . . . . . . . .

දෙවන භාෂා පරීක්ෂණය : . . . . . . . . . . . . . .

05. (අ) ශ්‍රී ලං.ප.සේ. III පන්තියේ හෝ / හා II පන්තියේ II ශ්‍රේණියේ අවුරුදු දහයක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ දිනය :-

(ආ) මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව II පන්තියේ I ශ්‍රේණියේ පිහිටුවීමට හිමිකම් ලබන දිනය :-

06. ඉහත 5 (අ) හි දක්වෙන දිනයට ඔබ සේවයේ ස්ථිර කරනු ලැබ සිටියේද ?

07. II පන්තියේ I ශ්‍රේණියට උසස් කරනු ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ ඔබ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයා ගෙන තිබේද ?

08. උසස් කරනු ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සිදු කර ඇති කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී සිටියේද ?................................... (එසේ නම් විස්තර)

09. වර්තමාන වාර්ෂික වැටුප :-

10. ඉහත 5 (ආ) ඡේදයේ සඳහන් කර ඇති දිනට මා ශ්‍රී ලං.ප.සේ. II පන්තියේ I ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සුදුසුකම් ලබා ඇති බවත්, ඉහත 1 සිට 9 දක්වා දී ඇති විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

. . . . . . . . . . . . . . . .
අයදුම්කරුගේ අත්සන

දිනය :- . . . . . . . . . .

<u>II වන කොටස</u>

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.**

. . . . . . . . . . . . .. . . . . මහතා/මහත්මිය/මෙනෙවිය විසින් මෙම ආකෘතියේ සපයා ඇති තොරතුරු පරික්ෂා කළ බවත්, පෞද්ගලික ලිපිගොනුවේ තොරතුරු අනුව ඒවා නිවැරදි බවත්, සහතික කරමි. ඒ අනුව ඔහුගේ/ඇයගේ පසුගිය අවුරුදු . . . . . . . සේවය සතුටුදායකය. අංක. . . . . . . . . . . . හා . . . . . . .. .. . දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඔහු / ඇය ශ්‍රී ලං.ප.සේ. II පන්තියේ I ශ්‍රේණියේ පිහිටුවනු ලැබීම සුදුසුය./ අමුණා ඇති ලිපියේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු අනුව මෙම අයදුම්පත නිර්දේශ නොකරමි.

(අදාල නොවන ද කපා හරන්න)

. . . . . . . . . . . . . . ..
අත්සන

. . . . . . . . . . . . . . .
නම හා තනතුර

දිනය :-

<u>III වන කොටස</u>

. . . . . . . . . . . . . . . . . මහතා/මහත්මිය/මෙනෙවිය ශ්‍රී ලං.ප.සේ. II පන්තියේ I ශ්‍රේණියේ පිහිටුවීමට සුදුසුකම් ලබා ඇත./ නැත.

එසේ පිහිටුවීම නිර්දේශ කරමි./ නොකරමි.

(අදාල නොවන ද කපා හරින්න.)

. . . . . . . . . . . . .. .
අත්සන

. . . . . . . . . . . . . . .
ලේකම් (නම)

. . . . . . . . . . . . . .
අමාත්‍යාංශය

දිනය :-